# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## විශ්වවිද්‍යාල ප්‍රවේශය – 2025/2026 අධ්‍යයන වර්ෂය

## ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂී දක්ෂතා සහිත අයදුම්කරුවන් සඳහා විශ්වවිද්‍යාල විශේෂ ප්‍රවේශය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය, කැළණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ක්‍රීඩා විද්‍යාව සහ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හා යාපනය විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශාරීරික අධ්‍යාපනය යන උපාධි පාඨමාලාවන් හැදෑරීම පිණිස ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂී දක්ෂතා පෙන්වා ඇති අපේක්ෂකයන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඉහත විශේෂ ප්‍රවේශය සඳහා අයදුම්කරුවන් සපුරාලිය යුතු අවශ්‍යතා :-**

- ඔලිම්පික් තරඟයකදී පදක්කම් ලබා තිබීම හෝ සහභාගිත්වය.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලකදී, ආසියානු ක්‍රීඩා උළෙලකදී හෝ සාක් ක්‍රීඩා උළෙලකදී අවම වශයෙන් රන් , රිදී හෝ ලෝකඩ පදක්කමක් ලබා තිබීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා , ආසියානු ක්‍රීඩා , සාක් ක්‍රීඩා හෝ පිළිගත් ලෝක කුසලාන තරඟයකදී ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරමින් ක්‍රිකට්, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් එවැනි ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු වීම.

මෙම විශේෂ ප්‍රවේශය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන අයදුම්කරුවන්,අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන පදනම් අධ්‍යයන පාඨමාලාවක් සම්පූර්ණ කල යුතුය.

ඉහත සියලු කරුණු සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026 සැප්තැම්බර් මස 08** වැනි දින දක්වා අයදුම්පත් බාර ගනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘතිය අනුව සැකසූ අයදුම්පත්‍රයක් නියමිත පරිදි සම්පූර්ණකර අදාළ සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් සමග **2026 සැප්තැම්බර් මස 08** වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් නියෝජ්‍ය ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රවේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට එවිය යුතුය.

**2026 සැප්තැම්බර් මස 08** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය වේ**.**

අයදුම්පත් බාර ගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සහ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 7
2026 අගෝස්තු 09

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂී දක්ෂතා සහිත අයදුම්කරුවන් සඳහා
## විශ්වවිද්‍යාල විශේෂ ප්‍රවේශ අයදුම්පත – 2025/2026 අධ්‍යයන වර්ෂය

**01.** අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :.........................................................

මුලකුරුවලින් හැඳින්වෙන නම :.........................................................

මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :.........................................................

**02.** ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය :.........................................................

**03.** උපන් දිනය :.............................. වයස .... ................

**04.** ජාතිය :.............................. ස්ත්‍රී /පුරුෂ..............

**05.** ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**06.** දුරකථන අංකය : (ස්ථාවර)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

: (ජංගම)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

**07.** ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් :.........................................................

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාග අංකය : ................................ වර්ෂය : .................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උසස් පෙළ) විභාග අංකය : .................................. වර්ෂය : ..................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

**08.** ලබා ඇති ක්‍රීඩා සුදුසුකම් :- (අදාළ සහතිකපත්වල සහතික කරන ලද පිටපත් අමුණන්න)

| වර්ෂය | සහභාගී වූ ක්‍රීඩා/ ඉසව්ව | පැවැත්වූ රට | සහභාගී වූ රටවල් ගණන | කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ | ලබාගත් ස්ථානය/ පදක්කම |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**09.** ඔබ විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලැබුවහොත් හැදෑරීමට කැමති පාඨමාලා අනුපිළිවෙල (ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය / ශාරීරික අධ්‍යාපනය යන පාඨමාලා සඳහා පමණක්) සඳහන් කරන්න.

| පාඨමාලාව | විශ්වවිද්‍යාලය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

**10.** අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද විස්තර සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි.
මා ඇතුලත් කර ගැනීමට පෙර එම විස්තර වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් මෙම අයදුම්පත ප්‍රතික්ෂේප වන බවද, මා ඇතුලත් කර ගැනීමෙන් පසු එම විස්තර වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් මා එම පාඨමාලාවෙන් සහ අදාළ උසස් අධ්‍යාපන ආයතනයෙන් නෙරපනු ලබන බවද, මම දනිමි.

ප්‍රවේශය සඳහා තෝරා ගනු ලැබුවහොත් මා අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ලිඛිත ව්‍යවස්ථා, අතුරු ව්‍යවස්ථා, නියෝග හා නීතිරීතිවලින් බැඳී සිටීමටද එකී ආයතනයේ ආචාර්යවරුන්ට හා නිලධාරීන්ට විනීත අයුරින් සැලකීමටද එකී ආයතනයේ හොඳ නමට කැළලක් නොවන අයුරින් හැසිරීමටද පොරොන්දු වෙමි.

.................................... ..........................................

දිනය අයදුම්කරුගේ අත්සන